පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# දෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 11

විෂයය :- **බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය**

පාසලේ නම : ..........................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය :

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 11 | 3 | 21 | 2 | 31 | 2 |
| 02 | 1 | 12 | 1 | 22 | 1 | 32 | 2 |
| 03 | 2 | 13 | 2 | 23 | 3 | 33 | 3 |
| 04 | 3 | 14 | 4 | 24 | 4 | 34 | 1 |
| 05 | 2 | 15 | 2 | 25 | 2 | 35 | 4 |
| 06 | 3 | 16 | 2 | 26 | 2 | 36 | 1 |
| 07 | 4 | 17 | 3 | 27 | 1 | 37 | 4 |
| 08 | 3 | 18 | 1 | 28 | 3 | 38 | 3 |
| 09 | 2 | 19 | 2 | 29 | 1 | 39 | 4 |
| 10 | 3 | 20 | 1 | 30 | 2 | 40 | 2 |

## II පත්‍රය

i. දාන, පිරිත, ධර්ම දේශනා, බෝධි පූජා, පාංශුකූල ......

ii. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ඡ කුක්කුච්ඡ, විචිකිච්ඡා.

iii. පිහිට වියයුතු විශේෂ පුද්ගලයන් සොයා වැඩම කිරීම.

iv. ධර්මයට අකමැති වෙයි, අසත්පුරුෂ ඇසුර ප්‍රිය කරයි, සත්පුරුෂ ඇසුර ප්‍රිය නොකරයි, නිදන සුලුයි, කථාවෙන් දවස ගෙවයි, උත්සාහයෙන් තොරයි, අලසයි.....

v. නිරෝගීව සිටියදී කිසිවකුගේ දුක සැප නොබැලීම.

vi. චාම් බව / සරල බව.

vii. කාම, භව, විභව.

viii. සුප්පිය පරිබ්‍රාජක

ix. සමාදාන - කළයුතු දේ (දන්දීම, මෛත්‍රී කිරීම ....
විරමණ - වෙන්වීම (සතුන් මැරීම, සොරකම ....)

x. දස සක්විති වත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති.....

- ප්‍රශ්න අංක 2 සිට 6 දක්වා III කොටස්වලට හා 7 ප්‍රශ්නයට සාපේක්ෂ පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න

01)

i. ලාභ,අලාභ, යස,අයස, නින්දා,ප්‍රසංසා, සැප,දුක.

ii. බුදුබව, මාර පරාජය, අනිමිස ලෝචන පූජාව, තනතුරු ප්‍රදානය....

iii.

| | | |
|---|---|---|
| බුද්ධත්වය | සසර දුකට හේතුවන කෙළෙස් සතුරා පැරදවීම | අරමුණ වෙනුවෙන් කැපවීම මතුපිටින් විසඳුම් නොසොයා මූලික හේතුවට පිළියම් යෙදීම |

| | | |
|---|---|---|
| මාර පරාජය | නිවනෙහි බාධක ඉවත් කිරීම | ඉගෙනුමේදී එන වෙනත් ආශාවන්, මැලිකම, සැකය, කේන්තිය වැනි බලවේග මැඩගැනීම |
| අනිමිස ලෝචනය | කළගුණ සැලකීම | උදව් කළ අයට ප්‍රති උපකාර කිරීම.<br>සොබා දහමට ආදරය කිරීම |
| අටලෝ දහමට මුහුණ දීම | ලාභ,අලාභ, යස,අයස, නින් දා,ප්‍රසංසා, සැප දුක් සම සිතින් ඉවසීම | ජීවිතයේ වරින්වර මුහුණ දීමට සිදුවන ඉහත අංග වලදී උපේක්ෂාවෙන් හා බුද්ධිමත්ව කටයුතු කිරීම. |
| තනතුරු ප්‍රදානය | බුද්ධත්වයෙන් තෙවන මස සංඝ සන්නිපාත අවස්ථාවේ අගසව් දෙනමට තනතුරු ප්‍රදානයේ දී ඡන්න හිමි විරුද්ධ වීම | යමක් දීමේදී හිතවත්කම් ඥාතිකම් නොබලා සුදුසුසාටම ලබාදීම |

ඉහත කරුණු දෙකක්වත් ඇසුරින් පැහැදිලිකිරීම ප්‍රමානවත් වේ.

3)

i. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ජති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤං විසෝධයේ.

ii. තමා කළ පාපයෙන් තමා අපිරිසිදු වෙයි
තමා පව් නොකළ විට තමාම පිරිසිදු වෙයි
පිරිසිදුකම, අපිරිසිදුකම තමා තුළ පවතී
එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැක,

iii. (උට්ඨානවතෝ ... නතං කම්මං කතං සාධු...... අක්කොච්ඡිමං ....)

බෞද්ධයාගේ අත්පොත ලෙස ධම්මපදය සමාජ ගතවී තිබේ. 1817 දිවි පිදූ කැප්පෙටිපොළ අධිකාරම් තුමා මෙය අත්පොතක් ලෙස භාවිතා කළබව සඳහන්වේ. මෙය නිතර පරිශීලනයෙන් චරිත සංවර්ධනය වේ. බු.ව. විවිධ ස්ථාන වලදී විවිධ හේතු මත විවිධ පුද්ගලයන් පාදක කර ගනිමින් කරන ලද දේශනා වල සංක්ෂිප්තයක් මෙහි ඇතුළත් වේ. පහසුවෙන් මතක තබාගතහැකි සේ ගාථාවට නගා තිබේ. විදේශ භාෂා රාශියකට පරිවර්තනය වී තිබේ. සූත්‍ර පිටකයේ කුද්දක නිකායට අයත් පොත් 15 අතරින් එකකි. ගාථා 423ක්, වර්ග 26ක් හා නිධාන කතා 299 කින් යුක්ත වේ. ධම්මපදට්ඨ කතාව මූලාශ්‍රය යි. ජාති, ආගම්, කුල, ස්ත්‍රී, පුරුෂ හා වයස් භේදයකින් තොරව සැමට ආදර්ශ සපයා ගතහැකිය.

අචරිත්වා බ්‍රහ්මචරියං..........
තරුණ වයසේදී කළයුතු දේ නොකොට පසුව පසුතැවෙන කොස්වා ලිහිණියන් මෙන් කළයුතු දේ නිසි වයසේදී නොකරන සිසුන්, තරුණයන් පිළිබඳ සමාජ තත්වය පැහැදිළි කිරීම.

උට්ඨානවතෝ............
මෙහි කරුණු 7කි. ඉන් කීපයක් පැහැදිළි කොට එයින් ජීවිතාභිවෘද්ධිය සලසා ගත හැකි අකාරය දක්වා තිබීම ප්‍රමානවත් වේ.
( **ඉහත දැක්වෙන පරිදි හැඳින්වීමක් හා ගාථා දෙකක් වත් නිදසුන් ලෙස පැහැදිලි කර ඇත්නම් ප්‍රමාණවත් වේ.** ධම්මපදයේ එන ඕනෑම ගාථා දෙකක් ඇසුරින් ලියූ පිළිතුරකට ලකුණු ලබා දෙන්න).

4)

i. මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින්, වචනයෙන් හා මනසින් කර්ම කරයි.

ii. දිට්ඨධම්ම වේදනීය - දේවදත්ත, චුන්ද සූකර....

උපපජ්ජවේදනීය - මට්ඨකුණ්ඩලී, අජාසත්ත,
අපරාපරිය - දානාදී පිංකම් කරන අය (දෙව්වරු වැනි)
අහෝසි - අංගුලිමාල, රහත්බව ප්‍රමාද යැයි කළකිරී සියදිවි හානි කිරීමට තැත්කළ භික්ෂුව....

**iii.** විපාක දෙන කාලය අනුව, ආකාරය අනුව, කාර්යය අනුව කර්මය ප්‍රභේද වන බව
කුසල අකුසල දෙපක්ෂයේම සරල බවේ සිට සංකීර්ණ බව දක්වා කර්මය වෙනස්වන බව
සුභ මානවක පුවත අනුව කර්ම විපාක ලැබීම හා පෙර භවය සහ මතු භවය සමග සබඳතා
වර්තමාන සමාජ තත්වය ආදී තොරතුරු.
පාපයට බියත්, පිනට කැමැත්තත් ඇතිවීම තුළ සමාජය යහපත් වන බව
ආදී තොරතුරු කීපයක් අතුළත් වීම ප්‍රමාණවත් වේ.

**5)**

**i.** මහා කාශ්‍යප මහරහතන් වහන්සේ
රජගහනුවර වේභාර පර්වත පාමුල සප්තපර්ණී ගුහාව අභියස

**ii.** ධර්මය එක්රැස් කිරීම
භාණක පරපුරට ධර්මය වෙන්කර දීම
විනය නීති වෙනස් නොකිරීම

**iii.** විනය ශාසනයේ පැවැත්මට බලපාන අයුරු
ධර්මය ආරක්ෂා වීම මත ශාසන පැවැත්ම සිදුවන අයුරු
විනය ආරක්ෂා වීම මත ශාසන පැවැත්ම සිදුවන අයුරු
ධර්ම ප්‍රචාරය නිසා සිදුවන යහපත
දූෂිතයන් ඉවත්වීම නිසා නිමල දහම සුරක්ෂිතවන බව
ග්‍රන්ථාරූඪ විම නිසා විකෘතියෙන් තොර දහම පසුකාලීනව දැනගත හැකිවීම
ආදී සෑම සංගායනාවක් පිළිබඳ තොරතුරු ඇතුළත් කළ හැකිය .

**6)**

**I.** අනුවණයින් ඇසුරු නොකිරීම
නුවණැත්තන් ඇසුරු කිරීම
සුදුසු ප්‍රදේශයක විසීම
වැඩිහිටියන්ට ගරු කිරීම
බොහෝ ඇසූපිරූ තැන් ඇතිබව
ශිල්ප ශාස්ත්‍රයෙහි ප්‍රගුණ බව
ඉවසීම

**II.** රජයට අයත් වීම
සොරුන් අතට පත්වීම
ගින්නෙන් හා ජලයෙන් විනාශ වීම
තමා ප්‍රිය නොකරන අයට අයත් වීම

**III.** බොහෝ දෙනා බුදුදහම පරලොව සඳහා යැයි පවතින වැරදි විශ්වාසය
පරලොව පමණක් නොව මෙලොව දියුණුවට ද දහම් දෙසා ඇති බව
බුදු දහම යථාර්ථවාදී බව
නිවන පවා මෙලොව දීම ලබාගත හැකි බව
මෙලොව දියුණුවට අදාළ දේශනා - කරණීය මෙත්ත, ව්‍යග්ඝපජ්ජ, කාලාම, මංගල,
සිගාලෝවාද.......

*7) පහත තේමා යටතේ එන රචනා වල කරුණු වලින් කීපයක් ඇතුළත් වන පරිදි වචන 75 -100 පමණ කෙටි සටහනක් ඇත්නම් ලකුණු පිරිනමන්න.*

**I.** <u>දුටුගැමුණු රජතුමා</u>

රුහුණු පෙළපතේ කාවන්තිස්ස හා විහාරමහා දේවිය ගේ කණිටු පුතුය. සොයුරු තිස්ස ය. කුඩා කලසිටම සංඝරත්නය සමඟ සමගියෙන් කටයුතුකිරීමට පියා සමඟ ගිවිසුම් ගතවිය. එකල අනුර පුර පාලකයා වූ එළාර රජු සමඟ සටන් කරන්නට තරුණ ගැමුණු සූදානම් වුවත් සුදුසු කාලය නොවන බැවින් පියා ඉඩ නොදුන් බැවින් මොහු කොත්මලයට පළාගොස් ක්‍රමයෙන් සේනා සූදානම් කර පියාගේ ඇවෑමෙන් සටන ඇරඹීය. විජිත පුර සටනින් එළාර පැරදවූයේය. ත්‍රිසිංහලය ජය ගත්තේය. එළාර රාජ්‍ය ගෞරව සහිතව ආදාහනය කර ඔහු වෙනුවෙන් සෑයක් සාදවා ගරු කිරීමට සැලසීම මහඟු ආදර්ශයකි.
රුවන්වැලි මහ සෑය, මිරිසවැටි සෑය, ලෝවාමහා පාය මොහුගේ විශිෂ්ඨ ශාසනික සේවාවන් අතර වේ. රාජ්‍යකළ සූවිසි වසර තුළ වෙසක් උත්සව 24ක් පැවැත්වීම, නිතර ධර්මශ්‍රවනය කිරීම, ආරෝග්‍යශාලා පිහිටුවා ජනසෙත සැලසීම, පිංපොතක් පවත්වා ගැනීම මොහුගේ ජීවිතයේ කැපී පෙනෙන සිදුවීම් ය.

අවසන් කාලයේ අසනීප වීම නිසා රුවන්වැලි දාගැබෙහි වැඩ අවසන් කිරීම සොයුරු සද්ධාතිස්සට නියම විය. තාවකාලිකව චෛතිය නිම කරවා රජුට දකින්නට සැලැස්වීය. පිංපොත අසමින් චෛතිය දෙස බලා අවසන් හුස්ම හෙලුවේය. ඔහු සියලු උත්සාහයන් ගත්තේ රජ සැප පිණිස නොව බුදු දහමේ චිර පැවැත්ම උදෙසා බැවින් මොහු නාමය බෞද්ධ ඉතිහාසයේ අමරණීය වේ.

## II. සඳකඩ පහණ

පඩිපෙළක ආරම්භයේ ඇති අර්ධ කවාකාර ගල් පුවරුව මෙනමින් හැඳින්වේ. ආගමික නොවන ගොඩනැගිලි වල කැටයම් රහිතව සහ බෞද්ධ සිද්ධස්ථානයක සම්පූර්ණ කැටයම් සහිත අලංකාර සඳකඩ පහණ දක්නට ලැබේ. අනුරාධපුරයේ මධ්‍ය යුගයේදී කලාත්මකම සඳකඩ පහණ දක්නට ලැබේ. නිදසුන් ලෙස අභයගිරියේ බිසෝ මාළිගය ලෙස හඳුන්වන පංචාවාස විහාරය, ශ්‍රී මා බෝධියේ නැගෙනහිර දොරටුව, ථූපාරාමය අසල පිහිටි නටබුන් විහාර මන්දිරය, රත්නප්‍රාසාදය පිටුපස ඇති නටබුන් විහාර මන්දිරය, පත්කුළිය නටබුන් විහාර මන්දිරය පෙන්වා දිය හැකිය. කැටයම් නිසා අතිඅලංකාරවූ බිසෝ මාළිගයෙහි සඳකඩ පහණෙහි පළාපෙති / ගිනිදලු (සසර), එකිනෙකා පසුපස දිවෙන ඇත් අස් සිංහ ගව රූප (ජාති ජරා ව්‍යාධි මරණ), සංකීර්ණ ලියවැළ (තද කෙළෙස්), තුඩින් නෙලුම් පොහොට්ටු ගත් හංස පේළිය (සසර බිය දැක ඉන් මිදීමට උත්සාහ දරන පිරිස), සරල ලියවැළ (තුනී වූ කෙළෙස්), නෙලුම් අර්ධය (පිරිසිදුබව - නිවන) දැකගත හැකිය. (මෙම කැටයම් වලට සපයා ඇති බෞද්ධ අර්ථ කථන වරහන තුළ දක්වා ඇත). එකිනෙක නිර්මාණයන්හි මෙය මදක් වෙනස් වුවද බොහෝ නිර්මානයන්හි මෙම කැටයම් දැකගත හැකිය. යුගය අනුවද මේවා වෙනස් වේ. නිදසුන් ලෙස පොළොන්නරුවේදී හින්දු ආභාසය නිසා ගවයා ඉවත් විය. මහනුවරදී අර්ධ කවය වෙනුවට ත්‍රිකෝණාකාර හැඩය ගත් අවස්ථාද ඇත. කෙසේ වුවද ලක් කලා කරුවාගේ කලා කෞශල්‍යය මෙමගින් මැනවින් ප්‍රකට වේ.

## III. සහජීවනය

මහින්දාගමනයෙන් උරුම වූ සංස්කෘතියෙහි එක් අනු අංගයක් වනුයේ සහජීවනයයි. එකිනෙකාගේ වෙනස් කම් හඳුනා ගනිමින්, ඒවාට ගරු කරමින් ගැටුම් ඇතිකර නොගෙන ජීවත් වීම මෙනමින් හැඳින්වේ. වෙයන් කුහුඹින් වැනි සතුන් අතරද සහජීවන පුරුදු දැකගත හැකි වේ. බහු ජාතීන් වෙසෙන රටකට බහු ආගමික පිරිස් වෙසෙන රටකට මෙය අත්‍යවශය වේ. අනෙකාගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කරමින් දුක සැප දෙකෙහි අන්‍යෝන්‍ය උපකාර සහිතව ශ්‍රමදාන, උත්සව ආදියට සහභාගි වෙමින් කටයුතු කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.
සතර සංග්‍රහ වස්තු, සිව්බඹ විහරණ, පංචශීලය හා රාජධර්ම ආදී බොහෝ තැන්වලින් සහජීවන සංකල්පය තහවුරු වේ. ලාංකිකයන් තුළ පවතින සහජීවන ආකල්ප සුළි සුළං, ගංවතුර, වසංගත වැනි විවිධ අපදා අවස්ථාවන්හි දී ප්‍රදර්ශනය වේ. මෙවන් අවස්ථාවල සිදු කෙරෙන පරිත්‍යාගයන් බෙහෙවින් වටී. අබලන් වන පාසල් පංසල් පල්ලි පාර රෝහල වැනි පොදු ස්ථාන සාමූහිකව පිළිසකර කරගත හැකිනම් කොතරම් වටින්නේද? බුදුරදුන් වාසෙට්ඨ සූත්‍රයේ දී පෙන්වා දුන් පරිදි මානවයා ජීව විද්‍යාත්මක ව සමානය. එබැවින් ජාති, කුල, ආගම් වශයෙන් බෙදීම නුසුදුසු ය. සහජීවනය උතුම් මානව ධර්මයකි.

## IV. ගුරු සිසු සබඳතා

සමාජ ප්‍රගමනය සඳහා ගුරු සිසු සබඳතාව අත්‍යවශ්‍ය සාධකයකි. ආචාර ධර්මයෙන් හා දැනුමෙන් සමාජය පොහොසත් වන්නේ මෙම සබඳතාව තහවුරු වූ තරමටය. බු.ව. සිගාලොවාද සූත්‍රයේදී සමාජ යුතුකම් රාශියක් පෙන්වා දෙති. ගුරුසිසු හමුවේදී ගුණගරුක සිසුවා ගුරුවරයා දුටුවිට හුනස්නෙන් නැගටීම, ඇප උපස්ථාන කිරීම,ඇහුම්කන් දීම, අවශ්‍ය කටයුතු කරදීම හා මැනවින් ඉගෙනීම සිදුකරයි. එවන් සිසුවා ට ගුරුවරයා ද මැනවින් හික්මවමින්, උගන්වමින්, ගුරුමුෂ්ටි නොතබා, තම වැදගත් මිතුරන්ට හඳුන්වා දෙමින්, සිසුවා ආරක්ෂා කරමින් ප්‍රති උපකාර කරයි.

වර්තමානයේ බොහෝවිට සිසුවා ගුරුවරයා දෙස බලන්නේ ගුරු ගෞරවයෙන් නොවේ. ඇතැම් ගුරුවරු සිසුන් දෙස බලන්නේද තම දරුවා යන ආකල්පයෙන් නොවේ. ධන ලෝභය, රාගය වැනි සිතුවිලි පදනම් ව කටයුතු කරනු පෙනේ. පරමාදර්ශී සමාජයක් උදසා මෙම සමාජ කණ්ඩායම් දෙක අතර සුහදතාව යළි ඇතිකරලීමේ කාලය උදාවී ඇත.